# පූර්ව ඓතිහාසික යුගයේ වැසියන් ජාත්‍යන්තර වශයෙන් වාණිජ සබදතා පැවැත්වූයේ ද යන්න පිළිබද විමර්ශනයක්

## (ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමිය ආශ්‍රයෙන්)

ඒ.එම්.එන්.කේ. අබේසිංහ

ඉතිහාසය අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nadeekaabesinghe21@gmail.com

ප්‍රමුඛ පද: ඉබ්බන්කටුව,පර්යේෂණ,ආනයනය,වාණිජ

### හැදින්වීම

ශ්‍රී ලංකාව ඈත අතීතයේ පටන්ම විදේශ රටවල් සමඟ සබඳතා පවත්වා ඇත.ලංකාවට ආසන්නතම රට වන්නේ ඉන්දියාවයි.පූර්ව ඓතිහාසික යුගයේ වැසියන් ජාත්‍යන්තර වශයෙන් වාණිජ සබදතා පැවැත්වූයේ ද යන්න පිළිබද විමර්ශනයක් සිදු කිරීමේ දී මේ සඳහා පාදක කරගනු ලබන්නේ ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමියයි.

යුග කරණය තුළලංකා ඉතිහාසය ප්‍රධාන අවධි කිහිපයකට බෙදා දැක්විය හැකිය.ඒවා ප්‍රාග් ඓතිහාසික අවධිය, පූර්ව ඓතිහාසික අවධිය (ප්‍රොටෝ ඓතිහාසික අවධිය), මුල් ඓතිහාසික අවධිය, මධ්‍ය ඓතිහාසික අවධිය ආදී වශයෙන් මේවා අනු අවධි කිහිපයකට ද බෙදේ. ප්‍රොටෝ ඓතිහාසික අවධියට අදාළව තොරතුරු ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලින් හමු වේ.මෙහිදී සාහිත්‍ය මූලාශ්‍රය තොරතුරු හමු වුවත් ඒවා ලේඛන කලාවේ ප්‍රාථමික අවධිය නියෝජනය කරනු ලබයි.මෙම අවධියට අදාළව තොරතුරු සෙවීමේදී බොහෝ දුරට පුරාවිද්‍යා මූලාශ්‍රය මත පදනම් වීමට සිදු වේ.ඒ අනුව මේ යුගයේ ජනතාව ජාත්‍යන්තර වශයෙන් වාණිජ සබදතා පැවැත්වූයේ ද යන්නත් ඒ සඳහා හමු වන සාධක මොනවා ද යන්නත් ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමිය ආශ්‍රයෙන් විමර්ශනය කරනු ලැබේ. එහිදී හමු වී ඇති පුරාවිද්‍යා දත්ත විශ්ලේශනය කොට ලබා ගන්නා තොරතුරු මෙම පර්යේෂණය සඳහා පාදක කරගන්නා ලදි. ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමිය ආශ්‍රිතව හමු වන පබළු,සංකේත අක්ෂර හා වෙනත් පුරාවිද්‍යා දත්ත මෙන්ම සුසානයේ හැඩය,නිර්මාණය ආදිය ද වැදගත් වේ.එසේම වාණිජ සබඳතා පැවැත්වූයේ කුමන ස්ථාන ආශ්‍රිතවද ආදිය පිළිබඳව ද අධ්‍යනය කරනු ලැබේ.

### ක්‍රමවේදය

පූර්ව ඓතිහාසික යුගයේ ජනතාව ජාත්‍යන්තර වශයෙන් වාණිජ සබදතා පැවැත්වූයේ ද යන පර්යේෂණ ගැටළුවට අදළව දත්ත එක්රැස් කිරීමේදී සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යනය කිරීම,ක්ෂේත්‍ර අධ්‍යනය,කෞතුකාගාර අධ්‍යනය ආදී ක්‍රමවේදයන් තුළින් මෙම පර්යේෂණයට අදාළ දත්ත එක්රැස් කරන ලදි.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

ලාංකික දේශීය ජනයා ලෝකයා සමඟ විවිධාකාරයේ සබඳතා පවත්වනු ලබයි.ඒ අතර ලාංකිකයා අතීතයේ සිටම වාණිජ සබදතාවන් ජාත්‍යන්තර වශයෙන් පවත්වා ඇති බවට තොරතුරු හමු වී ඇත.ඒ අනුව

මධ්‍යශිලා යුගයේදී ද මෙසේ වාණිජ සබඳතාවන් පැවති බවට ලංකාවෙන් එම යුගයට අදාළව ලැබී ඇති පුරාවිද්‍යා දත්ත තුළින් අනාවරණය කරගෙන යනු ලබයි.මෙම පර්යේෂණය සඳහා මූලික වශයෙන් පාදක කරගනු ලබන්නේ ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමියයි.දඹුල්ල,කුරුණෑගල මාර්ගයේ දඹුල්ලට සැතපුම් තුනක් දුරින් ගලේවෙල මාර්ගයේ පිහිටි ඉබ්බන්කටුව සුසාන භූමිය පූර්ව ඓතිහාසික යුගයට අයත් බවට කාබන් 14 කාලනිර්ණයට අනුව කාලනිර්ණය කර ඇත.මෙහි මූලික පර්යේෂණ කටයුතු රාජා ද සිල්වා මහතා විසින් 1970 සිදු කර ඇත.ඉන් පසු 1988-1990 දක්වා අවස්ථා තුනකදී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,මධ්‍යම සංස්කෘතික අරමුදල,ජර්මනියේ කාවා ආයතනය ක්‍රි.පූ. 600 ට අයත් සුසාන 21 ක් සොයාගෙන ඇත.2015 දී මධ්‍යම සංස්කෘතික අරමුදල සුසාන 47 ක් හමු විය.ඒ අතරින් ශිලා මංජුසා සුසාන 26 ක් හමු විය.මෙම සුසාන ආශ්‍රිතව හමු වී ඇති පුරාවිද්‍යා දත්ත තුළින් එකල වැසියා ඉන්දියාව සමඟ පැවැත්වූ වාණිජ සබඳතා පිළිබඳව අධ්‍යනය කළ හැකිය.මෙම හමු වී ඇති දත්ත අතර පබළුවලට විශේෂ වැදගත්කමක් හිමි වේ.විවිධ වර්ගයේ පබළු හමු වී ඇති අතර ඒවා කානීලියන්,ඇගේට්,ඔනෙක්ස්,ටෙරාකොටා වැනි ඛණිජ ද්‍රව්‍යවලින් නිර්මණය කොට ඇත.මෙහි ඇතැම් පබළු වර්ග ලංකාවේ දක්නට නොලැබෙන අතර එම නිසාම මේ පබළු වර්ග විදේශයන්ගෙන් ආනයනය කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය.විවිධ විද්වතුන් ද මේ පිළිබඳ අදහස් දක්වා ඇත.ඔස්මන් බෝපෙආරච්චි ප්‍රකාශ කරන්නේ මෙම පබළු වයඹ දිග හෝ නැගෙනහිර දිග ඉන්දියාවෙන් ආනයනය කරන්නට ඇති බවයි.කෙසේ නමුත් මේ පබළු ආනයනය කිරීම සඳහා යොදා ගන්නට ඇත්තේ ලංකාවේ කුමන වරායන් ද සහ ඒවා රට අභ්‍යන්තරයේ පිහිටි ඉබ්බන්කටුව දක්වා රැගෙන ආවේ කෙසේ ද යන ගැටළු පිළිබඳ මෙහිදී අධ්‍යනය කරනු ලබයි. ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමියට අමතරව ලංකාවේ ඊට සමකාලීන මෙගලිතික සුසානයන්ගෙන් මෙසේ පබළු හමු වී ඇති බවට තොරතුරු ලැබේ.ඒ අනුව ලංකාව තුළ විදේශීය වෙළඳ ද්‍රව්‍ය සැරිසරන්නට ඇති බවට උපකල්පනය කළ හැකිය.එසේම ඉහත පෙන්වා දුන් පබළු වර්ග නිර්මාණය කිරීම සඳහා යොදාගන්නට ඇති ඛනිජ වර්ග සමකාලීනව ව්‍යාප්ත වී ඇති රටවල් අනුව ලංකාව සමඟ වාණිජ සබඳතා පැවැත්වූ රටවල් මොනවාද යන්න පිළිබඳ හඳුනාගැනීමට හැකි වේ.

ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමියෙහි සොහොන් ගලක තිබී සොයා ගන්නා ලද සංකේත අක්ෂර දෙක තුළින් ද ඉහත කරුණු සනාථ කරගත හැකිය.මෙම සංකේත අක්ෂර ඉන්දියාවේ මොහෙන්දොජාරෝ හරප්පා ශිෂ්ටාචාරයේ මැටි පුවරුවල දක්නට ලැබෙන සංකේත අක්ෂරයන්ට සමාන බව සෙනරත් පරණවිතාන පෙන්වා දෙනු ලබයි. ඊට අමතරව සුදර්ශන් සෙනවිරත්න ද මෙම සංකේත අක්ෂර පිළිබඳ අදහස් දක්වා ඇත.ඔහු පවසන්නේ මේ තුළින් කිසියම් ජනකණ්ඩායමක්, වෙළඳ ශ්‍රේණියක්,ගෝත්‍රයක් ගම්‍යවන බවයි. රාජ් සෝමදේව මහතා අනුමාන කරන ආකාරයට දකුණු ආසියාවෙන් හමු වූ පැරණිම ශිලා සටහන මෙයනම් ඉහත පෙන්වා දුන් තොරතුරු අනුව විදේශිය රටවලින් වාණිජ කටයුතු සඳහා ප්‍රොටෝ ඓතිහාසික යුගයේදී ශ්‍රී ලංකාව සමඟ සම්බන්ධ වන්නට ඇතැයි සිතිය හැකිය.එමෙන්ම මෙම මහාශිලා සුසානයන් නිර්මාණය කිරීමේදී යොදා ගන්නට ඇතැයි සැලකෙන තාක්ෂණය හා සොහොන්වල හැඩය ආදිය පිළිබඳවද අවධානය යොමු කරනු ලැබේ.

සමස්තයක් ලෙස ගත් විට පූර්ව ඓතිහාසික අවධියේදී ජීවත් වූ ජනතාව ජාත්‍යන්තර වශයෙන් වාණිජ සබදතා පැවැත්වූයේ ද යන්න පිළිබද විමර්ශනයක් වන මෙහිදී ඉබ්බන්කටුව පූර්ව ඓතිහාසික මහාශිලා සුසාන භූමිය

## ආශ්‍රිත ග්‍රන්ථ


සෝමදේව, රාජ්. (2017)***ශ්‍රී ලංකාවේ ආදි ඉතිහාසය.***මහරගම:තියමුවා ප්‍රකාශන

විතානාච්චි, චන්දන රෝහණ.(2015)***පුරාවිද්‍යා ඇගයීම් සමීක්ෂණ වාර්තාව.*** උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය.

ඔබේසේකර, මිරැන්ඩෝ. (2006)***ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික උරුමය.***ජා ඇළ: සමන්ති පොත් ප්‍රකාශකයෝ.